1989-3-10

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1988 දෙසැම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : [illegible] තැපැල් ගාස්තුව : රු. 1.15 ශ.

1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1988 දෙසැම්බර් මස 17 වන දින]

එල්. ඩී.—ඕ. 46/83

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

පරිසර අධිකාරිය
1989-3-10

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1988 අංක 56 දරන ජාතික පාරිසරික (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන), 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ දීර්ඝ නාමය "පරිසරය ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා" යන වචන වෙනුවට "පරිසරය ආරක්ෂා කිරීම, කළමනාකරණය කිරීම සහ අභිවර්ධනය කිරීම සඳහා ද, පරිසරයේ තත්ත්වය විධිමත් කිරීම, පවත්වාගෙන යාම සහ එය පාලනය කිරීම සඳහා ද; පරිසර දූෂණය වැළැක්වීම, නතර කිරීම සහ පාලනය කිරීම සඳහා" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — 1980 අංක 47 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "සියලු මුදල් ප්‍රමාණයන් ; සහ" යන වචන වෙනුවට "සියලු මුදල් ප්‍රමාණයන් ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "සියලු මුදල් ප්‍රමාණයන්" යන වචන වෙනුවට "සියලු මුදල් ප්‍රමාණයන් ; සහ" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඈ) බලපත්‍ර ගාස්තු වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල් ප්‍රමාණයන්.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ (ඩ), (ණ) සහ (ත) යන ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඩ) වෙළෙඳ හා නාවික විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ණ) රාජ්‍ය ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

(ත) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් ;

ධ 000659—9,360 (88/09)

(ද) අධිකාරියේ තත්කාලයෙහි අධ්‍යක්ෂ-ජනරාල් ධුරය දරන තැනැත්තා ;

(න) පරිසර ක්ෂේත්‍රයේ ස්වේච්ඡා අනුයෝජිත ආයතනවල සම්බන්ධතා නියෝජනය කිරීම සඳහා සාමාජිකයන් හත් දෙනෙක් ; සහ

(ප) පරිසරය ආරක්ෂා කිරීමෙහි සහ කළමනාකරණය කිරීමෙහි ලා ප්‍රමාණවත් විශේෂඥතාවක් සහ පළපුරුද්දක් ඇති තැනැත්තන් අතුරෙන් සාමාජිකයන් දෙදෙනෙක්.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය 10 වන වගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ;

(3) නැවත අංක කරන ලද 10 වන වගන්තියේ (ඊ), (උ), (ඌ), (එ), (ඒ), (ඔ), (ඕ), සහ (ක) යන ඡේද (ඔ), (ඕ), (ක), (ග), (ච), (ඡ), (ට), සහ (ඩ) යනුවෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(4) නැවත අංක කරන ලද 10 වන වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ඊ) පරිසරය කරා අපද්‍රව්‍ය සහ දූෂිත ද්‍රව්‍ය පිටවීමට සහ පරිසරයේ තත්ත්වය ආරක්ෂා කිරීමට සහ වැඩි දියුණු කිරීමට අදාළ සියලු විධිමත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම ;

(උ) පරිසරයේ හෝ පරිසරයේ යම් ඛණ්ඩයක තත්ත්වයට අන්තරායදායක වන හෝ අන්තරායදායක විය හැකි අපද්‍රව්‍යයක, බැහැර කිරීමක, විමෝචනයන්හි, තැන්පතුවල හෝ දූෂණය පිළිබඳ වෙනත් ප්‍රභවයන්හි සහ උප ප්‍රභවයන්හි පරිමාව, වර්ග, සංඝටක හා ප්‍රතිඵල විධිමත් කිරීම, පාලනය කිරීම සහ පාලනය කිරීම ;

(ඌ) නව ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් සහ පවත්නා ව්‍යාපෘතීන්හි වෙනස්කම් ඇති කිරීම හෝ ඒවා අත්හැරීම සම්බන්ධයෙන් වූ යෝජනාවල වැඩදායී හෝ අහිතකර බලපෑම් අගැයීමේ කාර්යය සඳහා එවැනි යෝජනා ඉදිරිපත් කිරීමට නියම කිරීම ;

(එ) යම් පළාත් පාලන ආයතනයක පාලන සීමාව ඇතුළත පාරිසරික ආරක්ෂාව සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ සහ විශේෂයෙන්ම පාරිසරික දූෂණය පිළිබඳ පහත සඳහන් අංග සියල්ල හෝ ඒවා අතුරෙන් කවර වූ හෝ අංගයක් සම්බන්ධයෙන් වූ යම් නිර්දේශ අනුව ක්‍රියා කරන ලෙස හා ඒ නිර්දේශ බලාත්මක කරන ලෙස ඒ පළාත් පාලන ආයතනයට නියම කිරීම :—

(i) කුණු, අපද්‍රව්‍ය, කසළ සහ මළ අනවසරයෙන් බැහැර කිරීම, පිට කිරීම හෝ තැන්පත් කිරීම තහනම් කිරීම ;

(ii) පස, ඇළ මාර්ග හෝ දිය මාර්ග කරා පිළිසකර නොකළ මළ හෝ උපප්‍රමාණික කාර්මික පිටාර ගැලීම් හෝ විෂ රසායනික ද්‍රව්‍ය බැහැර කිරීම වැළැක්වීම ;

(iii) බිත්තිවල හෝ ගොඩනැගිලිවල හෝ වෙනත් යම් අවසර නොලත් ස්ථානවල පෝස්ටර හෝ දැන්වීම් පත්‍රිකා ප්‍රදර්ශනය කිරීම තහනම් කිරීම සහ ප්‍රචාරක දැන්වීම් පුවරු ඉදිකිරීම විධිමත් කිරීම ;

(iv) දර්ශනීය ස්ථාන සහ රජයේ දේපළ විරූප කිරීම වැළැක්වීම ;

(v) වායුගෝලය දූෂණය කිරීම පාලනය කිරීම ;

(vi) ඝෝෂා දූෂණය පාලනය කිරීම ; සහ

(vii) සෞඛ්‍යයට සහ පරිසරයට උපද්‍රවකාරී යම් ද්‍රව්‍යයක් ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම සහ බැහැර කිරීම ;

(ඒ) අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා ඊට සහායවීම පිණිස විශේෂ කමිටු පත් කිරීම ; ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සාමාන්‍යාධිකාරිවරයකු" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂ-ජනරාල්වරයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "සාමාන්‍යාධිකාරිවරයා" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂ-ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "සාමාන්‍යාධිකාරිවරයා" යන වචනය වෙනුවට "අධ්‍යක්ෂ—ජනරාල්වරයා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(4) ඒ වගන්තියේ පාර්ශ්ව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශ්ව සටහන ආදේශ කිරීමෙන් :—

" අධිකාරියේ
අධ්‍යක්ෂ-
ජනරාල්වරයා,
ලේකම්වරයා
සහ කාර්ය
මණ්ඩලය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි IVඅ, IVආ සහ IVඇ සහ අලුත් කොටස් ඇතුළත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස් මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ප්‍රධාන ප්‍රඥප්තියේ IVඅ, IVආ, සහ IVඇ කොටස් ලෙස බල පැවැත්විය යුතුය :—

" IVඅ කොටස

**පාරිසරික ආරක්ෂාව**

අපද්‍රව්‍ය, පරිසරය වෙත බැහැර කිරීම, පිට කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම.

23අ. (මෙහි මින්මතු " අදාළ දිනය " යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි, කවර හෝ තැනැත්තකු විසින්—

(අ) අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බල පත්‍රයක බලය යටතේ ; සහ

(ආ) මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ප්‍රමිතිවලට හා වෙනත් උප මානවලට

අනුකූලව හැර පරිසර දූෂණය සිදුවිය හැකි අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම, පරිසරයෙහි තැන්පත් කිරීම හෝ පරිසරය වෙත පිටකිරීම නො කළ යුතු ය.

බලපත්‍රයක් නිකුත් කිරීම.

23ආ. (1) අධිකාරිය විසින්, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක ඒ සඳහා අධිකාරිය වෙත කරනු ලබන යම් ඉල්ලීමක් මත සහ නියමිත ගාස්තුව ගෙවීම මත, මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හා උපමානවලට අනුකූලව අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීමට, පරිසරයෙහි තැන්පත් කිරීමට හෝ පරිසරය වෙත පිට කිරීමට යම් තැනැත්තකුට බලය පවරමින් ඒ තැනැත්තා වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) මේ කොටස යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක් ම—

(අ) නියම කරනු ලබන යම් ආකෘතියක විය යුතු ය ;

(ආ) නියම කරනු ලබන යම් ආකාරයන්ට, කොන්දේසිවලට සහ යම් ප්‍රමිතිවලට යටත් විය යුතු ය ;

(ඇ) බලපත්‍රයේ නියම කළ යුතු යම් කාලයක් සඳහා වලංගු විය යුතු නමුත්, එය මාස දොළහක කාලයකට වැඩි නොවිය යුතු ය;

(ඈ) අලුත් කළ හැකි විය යුතු ය.

ඉල්ලීමක් අධිකාරිය විසින් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ වෙත යොමු කරනු ලැබිය හැකි බව.

23ඇ. (1) 23ආ වගන්තිය යටතේ ඉල්ලීමක් ලැබුණු විට, එසේ කිරීම අවශ්‍ය යයි අධිකාරිය සළ කන අවස්ථාවක අධිකාරිය විසින්, එම ඉල්ලීම පිළිබඳව වාර්තාවක් සපයන ලෙස ඉල්ලා සිටිමින්, එම ඉල්ලීම අදාළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ වෙත යොමු කරනු ලැබිය හැකි ය.

(2) ඉල්ලීමක්, (1) වන උපවගන්තිය යටතේ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ වෙත යොමු කරනු ලබන අවස්ථාවක, ඊට අදාළව එම දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් හෝ වාර්තාව අධිකාරිය වෙත ලැබෙන තුරු අධිකාරිය විසින් ඒ ඉල්ලීම සම්බන්ධයෙන් කිසිදු තීරණයක් නොගත යුතු ය.

බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම.

23ඈ. මේ කොටස යටතේ යම් තැනැත්තකු වෙත බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සහ ඒ තැනැත්තා විසින් බලපත්‍රයෙහි ඇතුළත් නියම, ප්‍රමිති සහ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කර මින් ක්‍රියා කර ඇති අවස්ථාවක හෝ ස්වභාවික සාධක නැතහොත් වෙනත් හේතු මගින් අපද්‍රව්‍ය ලබන පරිසරය වෙනස් කර හෝ වෙනස් වී හෝ තිබෙන අවස්ථාවක හෝ බලපත්‍රයේ බලය යටතේ අපද්‍රව්‍ය පරිසරය වෙත බැහැර කිරීම, පරිසරයෙහි තැන්පත් කිරීම හෝ පරිසරය වෙත පිට කිරීම දිගටම කරගෙන යාම වැඩදායී ලෙස උපයෝගී කර ගැනීමකට පටහැනි ලෙස බලපාන හෝ බලපෑ හැකි අවස්ථාවක හෝ අධිකාරය විසින් නියමයන් මගින් ඒ නියමයෙහි සඳහන් යම් කාලයක් සඳහා ඒ බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ කළ හැකි ය.

බලපත්‍ර යනාදිය ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධ අභියාචනා.

23ඉ. (1) අධිකාරිය විසින්, බලපත්‍රයක් ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුකොටගෙන අතෘප්තියට පත් මේ කොටස යටතේ බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කළ යම් ඉල්ලුම්කරුවකු විසින් හෝ එසේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් අත්හිටුවීම හෝ අවලංගු කිරීම හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුකොට ගෙන අතෘප්තියට පත් මේ කොටස යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක් දරන්නකු විසින් හෝ ඒ තීරණය දැනුම්දීමේ දිනට පසුව

දින තිහක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතික්ෂේප කිරීමට, අත්හිටුවීමට, අවලංගු කිරීමට හෝ අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ලියවිල්ලකින් අභියාචනය කළ හැකි ය.

(2) එවැනි යම් අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

## IVඇ කොටස

## පාරිසරික තත්ත්වය

**දේශීය ජලතීරය දූෂණය කිරීම සීමා කිරීම විධිමත් කිරීම හා පාලනය කිරීම.**

23උ. මේ පනතේ 23ආ වගන්තියට යටත් අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හෝ උපමානවලට අනුකූලව හැර කිසිම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකා දේශීය ජල තීරය තුළ අපද්‍රව්‍ය තැන්පත් කිරීම හෝ ඒ තුළට පිට කිරීම හෝ නොකළ යුතු ය.

**ශ්‍රී ලංකාවේ දේශීය ජලතීරය දූෂණය කිරීම.**

23ඌ. (1) කිසිම තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයක් හෝ ඒ දේශීය ජල තීරයෙන් යම් කොටසක් හෝ අපවිත්‍රවීම, අහිතකරවීම, විෂ වීම, අපිරිසිදුවීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට, සුභ සාධනයට, ආරක්ෂාවට හෝ දේපළට හානි කර වීම, සත්වයන්ට, කුරුල්ලන්ට, වනසතුන්ට, මත්ස්‍යයන්ට, ශාකවලට හෝ වෙනත් ආකාරයේ ජීවීන්ට විෂ සහිත වීම හෝ හානිදායක වීම, නැත හොත් ඒ ජලතීරය වැඩදායී ලෙස උපයෝගී කිරීමෙහි ලා හානිකර වීම සිදුවන පරිදි හෝ එසේ සිදුවෙතැයි සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි ඒ ජල තීරයේ භෞතික, රසායනික හෝ ජෛවී තත්ත්වය වෙනස් වන ආකාරයෙන් ඒ දේශීය ජල තීරය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එසේ දූෂණය කිරීම සැලැස්වීමෙහිලා අවසරදීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින්—

(අ) යම් ජල තීරයක හෝ යම් ජල තීරයක් මත හෝ යම් ජල තීරයක් වෙත ප්‍රවේශය ඇති විය හැකි ස්ථානයක, මේ පනත මගින් හෝ ඒ යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් තහනම් කරනු ලැබූ ඝන, දියර හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් ;

(ආ) ඝණ, දියර හෝ වායුමය වන්නා වූ යම් අපද්‍රව්‍ය යම් ජලතීරයක් තුළට හෝ විය ලිව පවත්නා විටක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජල මාර්ගයක පත්ලට ඇද වැටීම, අවරෝහණයවීම, බැසයාම, වාෂ්පවීම, සෝදා ගෙන යාම, සුලඟට ගසාගෙන යාම හෝ කාන්දුවීම සිදුවන ඉරියව්වක ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ එසේ ඇද වැටීමට, අවරෝහණය වීමට, බැසයාමට, වාෂ්පවීමට, සෝද ගෙන යාමට හෝ කාන්දුවීමට ඉඩ ඇති ඉරියව්වක ස්ථාපනය කරනු ලැබුව හොත් නැතහොත් දැනුවත්ව හෝ ස්වකීය නොසලකා හැරීම මගින්, කෙළින් ම හෝ නො එසේම, එවැනි යම් ද්‍රව්‍යයක් එවැනි ඉරියව්වක ස්ථාප නය කිරීමට සැලැස්සුවහොත් හෝ එහිලා අවසර දුනහොත් ;

(ඇ) වියලිව පවත්නා විටක යම් ගංගාවක, ඔයක හෝ වෙනත් ජල මාර්ගයක පත් ලෙහි අපද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ දැනුවත්ව හෝ ස්ව කීය නොසලකා හැරීම මගින්, එවැනි පත්ලක යම් අපද්‍රව්‍යයක් ස්ථාපනය කිරීමට සැලැස්වුවහොත් හෝ එහිලා අවසර දුනහොත් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ දේශීය වෙරළබඩ හෝ අක් වෙරළ ජල තීරයේ උෂ්ණත්වය, නියමිත සීමාවට වඩා වැඩි කිරීම හෝ අඩු කිරීම සලස්වනු ලැබුවහොත්

(1) වන උපවගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි, ඔහු විසින් ඒ උපවගන්තියේ විධි විධාන කඩ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1)වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී—

(අ) රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද දඩයකට සහ ඉන් අනතුරුව එම වරද දිගටම කරනු ලබන අවස්ථාවක එම වරද එසේ දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන් සියයක දඩයකට ඔහු යටත් විය යුතු ය ; තවද

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත, ශ්‍රී ලංකාවේ දේශීය, වෙරළබඩ සහ අක් වෙරළ ජල තීරයට තවදුරටත් හානි සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලෙස සහ එවැනි නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලද බවට ප්‍රමාණවත් හා පිළිගත හැකි සාක්ෂි ඒ කාලය අවසානයේ දී ඉදිරිපත් කරන ලෙස ඔහුට නියම කළ යුතු ය. එම වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විටත් සිදුව ඇති හානිය නිරවද්‍ය කිරීමෙහිලා අධිකාරිය විසින් දරනු ලැබිය හැකි වියදම් දරන ලෙස ද අධිකරණය විසින්, වරදකරු කරනු ලැබූ ඒ තැනැත්තාට නියම කළ යුතු අතර, එසේ දරන ලද වියදම් දැරීම, ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, අධිකරණය විසින් නියම කරන ලද දඩයක් පරිද්දෙන් ඒ වියදම් අයකර ගනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වූ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට සති හයක කාලයකට පසුව ඒ වරද දිගටම කරගෙන යනු ලබන අවස්ථාවක, තවදුරටත් හානි සිදු කිරීම වැළැක්වීමෙහිලා ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් නිරවද්‍ය කිරීමේ පියවර ගනු ලබන තෙක්, ශ්‍රී ලංකාවේ දේශීය, වෙරළබඩ හෝ අක් වෙරළ ජල තීරය දූෂණය වීම සිදු කළ ඒ ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත ඒ කර්මාන්ත ශාලාව, කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙසද අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන කවර හෝ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින්, ආඥාවක් මගින්, ඒ ආඥාව නිකුත් කළ දිනයේ සිට පැහැදිලි දින තුනකට කලින් හෝ දින හතකට පසුව නොවිය යුතු ඒ ආඥාවේ සඳහන් දිනයකට පෙර ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන ඒ

කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙස අධිකරණයේ පිස්කල්ට නියම කරමින් හා බලය දෙමින් ඒ පිස්කල් වහාම අණ කල යුතු ය. ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා එකී පිස්කල් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් සහායකයන් ද සමග ඒ ස්ථානයට ඇතුළුවීම සඳහා ඒ පිස්කල්ට හෝ එම පොලිස් නිලධරයාට ඒ නියෝගය ප්‍රමාණවත් අධිකාරයක් විය යුතු ය.

**වායුගෝලය දූෂණය කිරීම පිළිබඳ සීමා කිරීම්.**

23එ. මේ පනතේ 23ඈ වගන්තියට යටත්ව අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හා උපමානවලට අනුකූලව හැර කිසිම තැනැත්තකු විසින්, වායු ගෝලය වෙත අපද්‍රව්‍ය බැහැර කිරීම හෝ ඒ තුළට පිට කිරීම හෝ නොකළ යුතු ය.

**වායුගෝලය දූෂණය කිරීම.**

23ඒ. (1) කිසිම තැනැත්තකු විසින් වායුගෝලය අපවිත්‍ර වීම, අහිතකර වීම, විෂවීම, අපිරිසිදුවීම, මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට, සුභ සාධනයට, ආරක්ෂාවට හෝ දේපළට හානිකර වීම, සත්ව යන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ශාකවලට හෝ වෙනත් සියලු ආකාරයෙන් ජීවීන්ට, විෂ සහිත වීම හෝ හානිකර වීම, නැතහොත් ඒ වායුගෝලය වැඩදායි ලෙස උපයෝගි කිරීමෙහි ලා හානිකර වීම සිදුවන පරිදි හෝ එසේ සිදුවෙතැයි සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි ඒ වායුගෝලයේ භෞතික, රසායනික හෝ ජෛවී තත්ත්වය වෙනස්වන ආකාරයෙන් ඒ වායුගෝලය දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එසිලා අවසරදීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින්—

(අ) මේ පනත මගින් හෝ ඒ යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් වායුගෝලයේ ස්ථාපනය කිරීම තහනම් කරන ලද දියර, ඝන හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් වායු ගෝලයේ ස්ථාපනය කරනු ලැබුව හොත්, හෝ වායු ගෝලය වෙත මුදා හරිනු ලැබිය හැකි යම් ආකාරයකින් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ මේ පනත යටතේ ඒ සඳහා නියම කරන ලද නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුවහොත් ;

(ආ) ස්වභාවය, එකතුවීම, ප්‍රමාණය හෝ විශාලත්වය හේතු කොට ගෙන මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියයන්ට පිළිකුල් උපදවන හෝ අනිසි ලෙස පීඩාකාරීවන ගඳ බැහැර වීමට සැලැස්වුවහොත් හෝ එහිලා ඉඩ දුනහොත් ;

(ඇ) නියමිත කාලය හෝ ආකාරය හෝ ස්ථානය නොවන අන්‍යාකාරයකින් අපද්‍රව්‍ය පිළිස්සුවහොත් ;

(ඈ) දූෂණය වැළැක්වීම හෝ අඩු කිරීම සඳහා අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇංජිමකට හෝ ඉන්ධන දැවීමේ උපකරණයකට සවි කළ යුතු යයි නියෝගවලින් නියමිත යම් යම් ක්‍රමෝපායයක් සවි නොකරනු ලැබූ එවැනි අභ්‍යන්තර ගිනි ඇවිලවීමේ ඇංජිමක් හෝ ඉන්ධන දැවීමේ උපකරණයක් පාවිච්චි කරතහොත් ; හෝ

(ඉ) මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග මගින් තහනම් කරන ලද ඉන්ධන කිසිවක් පාවිච්චි කරතහොත් හෝ පුළුස්සනු ලැබුවහොත්,

(1) වන උපවගන්තියේ ව්‍යාප්තියට සීමාවක් නොවන පරිදි ඔහු විසින් ඒ උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන සෑම තැනැත්තකුම වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී—

(අ) රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද දඩයකට සහ ඉන් අනතුරුව එම වරද සිදු කිරීම දිගට ම කරනු ලබන අවස්ථාවක, එම වරද එසේ දිගටම සිදු කරනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන් සියයක දඩයකට ඔහු යටත් විය යුතු ය ; තව ද

(ආ) අධිකරණය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් ඇතුළත වායුගෝලය දූෂණය කිරීම මගින් වැඩිදුර හානි සිදුවීම වැළැක්වීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලෙස සහ එවැනි නිරවද්‍ය කිරීමේ පියවර ගන්නා ලද බවට ප්‍රමාණවත් හා පිළිගත හැකි සාක්ෂි ඒ කාලය අවසානයේදී ඉදිරිපත්

කරන ලෙස ඔහුට නියම කළ යුතු ය. එම වරද සිදු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඒ වන විටත් සිදුව ඇති හානිය නිරවද්‍ය කිරීමෙහි ලා අධිකාරිය විසින් දරනු ලැබිය හැකි වියදම් දරන ලෙස ද අධිකරණය විසින් වරදකරු කරනු ලැබූ ඒ තැනැත්තාට නියම කළ යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, ඔහු වරදකරු කරනු ලැබූ දින සිට සති හයක කාලයකට පසුව, ඒ වරද දිගටම සිදු කරගෙන යනු ලබන අවස්ථාවක, තවදුරටත් හානි සිදුකිරීම වැළැක්වීමෙහිලා ඒ තැනැත්තා විසින් ප්‍රමාණවත් නිරවද්‍ය කිරීමේ පියවර ගනු ලබන තෙක් වායු ගෝලයේ දූෂණය සිදු කළ ඒ ස්ථානයේ පවත්වා ගෙන යනු ලබන ඒ කර්මාන්ත ශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙනු ලැබූ යම් නිලධරයකු විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධිකරණය විසින් ආඥා කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වසා දැමීමේ ආඥාවක් අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලබන කවර හෝ අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ආඥාවක් මගින්, ඒ ආඥාව නිකුත් කළ දිනයේ සිට පැහැදිලි දින තුනකට කලින් හෝ දින හතකට පසුව නොවිය යුතු දිනයක් විය යුතු ඒ ආඥාවේ සඳහන් දිනකට පෙර, ඒ ස්ථානයෙහි පවත්වා ගෙන යනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දමන ලෙස අධිකරණයේ පිස්කල්ට නියම කරමින් හා බලය දෙමින්, ඒ පිස්කල්ට වහාම ආඥා කළ යුතු ය. ඒ ස්ථානයෙහි පවත්වාගෙන යනු ලබන ඒ කර්මාන්තශාලාව හෝ කර්මාන්තය හෝ ව්‍යාපාරය වසා දැමීම සඳහා එකී පිස්කල් විසින් හෝ ඔහු විසින් ඒ සඳහා බලය දෙන ලද යම් පොලිස් නිලධරයකු විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් සහායකයන් ද සමග ඒ ස්ථානයට ඇතුළුවීම සඳහා ඒ පිස්කල්ට හෝ පොලිස් නිලධරයාට ඒ ආඥාව ප්‍රමාණවත් අධිකාරයක් විය යුතු ය.

නියමිත පාලන උපක්‍රම සවිකොට පවත්වාගෙන යාම පැහැර හැරීම වරදක් බව.

23ඔ. මේ පනත මගින් හෝ මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් මගින් හෝ ඒ යටතේ, වායු ගෝලය දූෂණය වීම වැළැක්වීම හෝ සීමා කිරීම සඳහා වූ යම් උපක්‍රමයක් සහිතව තනනු ලැබීමට, සවි කරනු ලැබීමට හෝ සප්

ජිත කරනු ලැබීමට නියම කර ඇති යම් යන්ත්‍රෝපකරණයක්, වාහනයක් හෝ බෝට්ටුවක්, ඒ යන්ත්‍රෝපකරණය, වාහනය හෝ බෝට්ටුව එසේ තනනු නොලැබ සවි කරනු නොලැබ හෝ සජ්ජිත කරනු නොලැබ සතුව සිටින, පාවිච්චි කරන, මෙහෙයවන, ඉදි කරන, විකුණන සවි කරන හෝ විකුණන නැතහොත් විකිණීමට හෝ සවි කිරීමට ඉදිරිපත් වන යම් තැනැත්තෙක් වරදක් කරන්නේ ය. මේ වගන්තිය යටතේ තනනු ලබන, සවි කරනු ලබන හෝ සජ්ජිත කරනු ලබන සියලු උපක්‍රම අධිකාරියේ වියදමින් පවත්වා ගෙන යාම හා ක්‍රියාත්මක කිරීම කළ යුතු ය.

පස දූෂණය කිරීම සීමා කිරීම, විධිමත් කිරීම හා පාලනය කිරීම.

23ඕ. මේ පනතේ 23අ වගන්තියට යටත්ව, අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, මේ පනත යටතේ නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිතිවලට හා උපමානවලට අනුකූලව හැර, කිසිම තැනැත්තකු විසින්, අපද්‍රව්‍ය පසට බැහැර කිරීම හෝ පසෙහි තැන්පත් කිරීම හෝ නොකළ යුතු ය.

පස දූෂණය කිරීම වරදක් බව.

23ක. (1) කිසිම තැනැත්තකු විසින් පස හෝ පසෙහි නිෂ්පාදනය මනුෂ්‍ය වර්ගයාගේ සෞඛ්‍යයට හෝ සුභ සාධනයට විෂවීම හෝ අපවිත්‍රවීම, හානි කරවීම හෝ හානිකර විය හැකි වීම, සත්වයන්ට, කුරුල්ලන්ට, වන සතුන්ට, ශාකවලට හෝ වෙනත් සියලු ආකාරයෙන් ඒ ජීවීන්ට විෂ සහිතවීම හෝ හානිකර වීම හෝ මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රිය යන්ට අහිතකර වීම හෝ අනිසි ලෙස පීඩාකාරීවීම හෝ සිදුවන පරිදි නැතහොත් හෝ ඉඩම පලදායී ලෙස පාවිච්චි කිරීමෙහිලා හානි කර වන පරිදි හෝ එසේ සාධාරණ ලෙස බලාපොරොත්තු විය හැකි පරිදි, යම් පසක් හෝ ඉඩමක මතුපිට භෞතික, රසායනික හෝ ජෛවී තත්ත්වය වෙනස්වන ආකාරයෙන් ඒ පස හෝ ඉඩමේ මතුපිට දූෂණය කිරීම හෝ දූෂණය කිරීමට සැලැස්වීම හෝ එහිලා අවසරදීම නොකළ යුතු ය.

(2) යම් තැනැත්තකු විසින්—

(අ) යම් පසක හෝ යම් පසක් මත යම් පසකට ප්‍රවේශය ඇති විය හැකි යම් ස්ථානයක මේ පනත මගින් හෝ ඒ යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග කිසිවක් මගින් තහනම් කරනු ලැබූ දියර, ඝන හෝ වායුමය වන්නා වූ යම් ද්‍රව්‍යයක් ස්ථාපනය කරනු ලැබුවහොත් හෝ නියම කරනු ලැබිය හැකි නියෝග කිසිවක් අනුව ක්‍රියා කරනු නොලැබුවහොත් ; සහ

(ආ) මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියන්ට අහිතකර වන හෝ අනිසි ලෙස පීඩාකාරී වන නැතහොත් පොළොව යට ඇති ජලය දූෂණය කරවන හෝ ඊට අනිෂ්ට බලපෑම් ඇති කරවන හෝ පසු හෝ ඉඩම් මතුපිට පල දායී ලෙස පාවිච්චි කිරීමෙහිලා හානිකර වන පරිදි කසළ ගොඩක්, කුණු වළක්, පස් හා ගල් බැහැර කරන බිමක්, ගොහොරු මඩ තැන්පත් කරන බිමක්, අපද්‍රව්‍ය විදින ළිඳක් හෝ යම් ඉඩමක පිහිටුවුවහොත් හෝ ඝන හෝ දියර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා හෝ ගර්භ යක් වශයෙන් ඉඩම අනාකාරයකින් පාවිච්චි කරත හොත්

(4) එක උපවගන්තියේ විඥප්තියට සීමාවක් නොවන පරිදි ඔහු විසින් ඒ උපවගන්තියේ විධිවිධාන කඩ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) නිර්දිෂ්ට පලිබෝධකයකු පාලනය කිරීම පිණිස නියමිත ආකාරයකින් අනුමත ඖෂධ සංයෝගයක් යෙදීම වැනි විලංගු හේතු සඳහා පූර්ව නිදහස් කිරීම් ප්‍රදානය කරනු ලැබිය හැකි ය; එසේ වුව ද එවැනි ඖෂධ සංයෝගයකින් පසට තද බල ලෙස හානි සිදු නොවිය යුතු ය.

(4) මේ වගන්තියේ විධිවිධාන අතුරෙන් කවර හෝ විධිවිධානයක් කඩ කරන යම් තැනැත්තෙක් වරදක් කරන අතර, වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසකට නොඅඩුවූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද දඩයකට සහ ඒ වරද නොකඩව කර ගෙන යනු ලබන වරදක් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසුව ඒ වරද නොකඩව කර ගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් පන්සියයක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

ශබ්ද දූෂණය සීමා කිරීම.

**23ග.** මේ පනතේ 24ආ වගන්තියට යටත්ව, අදාළ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි කිසිම තැනැත්තකු විසින්, ශබ්දයක පරිමාව අධික බව හා ප්‍රමාණය සම්බන්ධයෙන් නියම කරනු ලැබිය හැකි යම් ප්‍රමිති හෝ සීමා කිරීම් ඒ තැනැත්තා විසින් පිළිපදිනු ලබන්නේ නම් මිස, එවැනි අධික ශබ්දයක් පිට කිරීමට ඔහු විසින් අවසර දෙනු නො ලැබිය යුතු ය.

**ඇතැම් ශබ්ද විහිදුවීම සඳහා බලපත්‍ර දිය යුතු බව.**

23ච. (1) මේ පනත යටතේ අධිකාරිය විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක අධිකාරය යටතේ හැර, කිසිම තැනැත්තකු විසින් ඇරිය හැකි ප්‍රමාණයේ ශබ්දයක් සඳහා නියම කර ඇති මට්ටමේ පරිමාවට අධික බවට හෝ ප්‍රමාණයට වඩා අධික ශබ්දයක් ඇති කිරීමට හෝ පිට කිරීම නැතහොත් ඇති කරනු ලැබීමට හෝ පිට කරනු ලැබීමට සැලැස්වීම හෝ එහිලා අවසර දීම නොකළ යුතු ය.

(2) 23ආ, 23ඇ, 23ඈ හා 23ඉ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් නිකුත් කිරීම හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) මේ පනතෙහි සඳහන් කරුණුවලින් කිසිවකට අදාළව බලපත්‍ර නිකුත් කිරීමට වෙනත් යම් ලිඛිත නීතියකින් බලය පවරනු ලැබ ඇති යම් අධිකාරියක් හෝ ආයතනයක්, මේ පනත යටතේ නිශ්චිත ප්‍රමිතිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

**අධික ශබ්දය වරදක් බව.**

23ජ. (1) බලපත්‍රයක් නොමැතිව හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වූ බලපත්‍රයක් යටත් වන්නේ යම් කොන්දේසියකට, සීමා කිරීමකට හෝ තහනම් කිරීමකට ද ඒ කොන්දේසියට, සීමා කිරීමට හෝ තහනම් කිරීමට පටහැනිව, අවස්ථානුගත කරුණු අනුව මධ්‍යස්ථ ප්‍රමාණයේ ශබ්දයක් වන්නා වූ ශබ්දයක් පිට කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි ප්‍රමිතියට වඩා පරිමාවෙන්, අධික බවින් හෝ ප්‍රමාණයෙන් අධික ශබ්දයක් ඇති කරන හෝ පිට කරන නැතහොත් ඇති කරනු ලැබීමට හෝ පිට කරනු ලැබීමට සලස්වන හෝ එහිලා අවසර දෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකට වරදකරු වන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබීමේදී රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නා වූ ද දඩයකට සහ ඒ වරද නොකඩවා කර ගෙන යනු ලබන වරදක් වන විට, වරදකරු කරනු ලැබීමෙන් පසුව, ඒ වරද නොකඩවා කර ගෙන යනු ලබන සෑම දිනයක් සඳහාම රුපියල් පන් සියයක දඩයකට ද ඔහු යටත් විය යුතු ය.

**කුණු රොඩු ඉවත් කිරීමට දැන්වීම.**

23ට. පොදු හෝ පෞද්ගලික හෝ යම් ස්ථානයක තැන්පත් කර ඇති කුණු රොඩු කිසිවක් මගින්, මහජනයාගේ සෞඛ්‍යයට, ආරක්ෂාවට හෝ සුභසාධනයට හානිකර වන්නා වූ හෝ හානිකර විය හැකි වන්නා වූ හෝ, මනුෂ්‍ය වර්ගයාගේ ඉන්ද්‍රියයන්ට අනිසි ලෙස පීඩාකාරී වන්නා වූ හෝ පරිසරයට අන්තරාදායක වන්නා වූ ආකාරයට අවස්ථානුගත කරුණු එළඹ ඇති බවට අධිකාරියේ මතය වන අවස්ථාවක, අධිකාරිය විසින්, ලියවිල්ලකින් වූ දැන්වීමක් මගින් ඒ කුණු රොඩු ඉවත් කරන ලෙස හෝ ඒ කුණු රොඩු වලට අදාළව ඒ දැන්වීමෙහි සඳහන් යම් ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස, ඒ කුණු රොඩු තැන්පත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තාට හෝ ඒ කුණු රොඩු බැහැර කිරීම හෝ ඉවත් කිරීම ස්වකීය කර්තව්‍ය වන යම් රජයේ අධිකාරියකට හෝ විධාන කළ හැකි ය.

මෙම වගන්තියේ කාර්ය සඳහා "කුණු රොඩු" යන්නෙන්, නිෂ්පාදන ක්‍රියා වලියක දී මතු වූ අතුරු නිෂ්පාදිතයක් හෝ ඒහි වැඩදායක ක්‍රියාකාරී ජීවය අවසන් කර ඇති හා ඉවත ලා ඇති නිෂ්පාදිතයක් හෝ වන්නා වූ අනවශ්‍ය අපද්‍රව්‍යයක් අදහස් වේ.

**කුණු රොඩු ඉවත් කිරීමේ ගාස්තුව ඊට වගකිව යුතු තැනැත්තාගෙන් අයකර ගත හැකි බව.**

23ඩ. 23ට වගන්තිය යටතේ දෙනු ලැබූ දැන්වීමක් අනුව කුණු රොඩු ඉවත් කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ හෝ අඩු කිරීමේ ගාස්තුව අධිකාරියට ලැබිය යුතු ණයක් වශයෙන් නිසි අධිකරණ බලය ඇති යම් අධිකරණයක දී, ඒ කුණු රොඩු තැන්පත් කරන ලද බවට ඔප්පු වූ යම් තැනැත්තකුගෙන් අයකර ගනු ලැබිය හැකි අතර, ඒ ගාස්තුව එසේ අයකර ගනු ලැබූ විට අධිකාරියේ අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

**දැන්වීම අනුව ක්‍රියා කිරීම පැහැර හැරීම වරදක් බව.**

23ණ. 23ට වගන්තිය යටතේ ලියවිල්ලකින් වූ දැන්වීමක් යොමු කරනු ලැබුවේ යම් තැනැත්තකුට ද ඒ තැනැත්තා සාධාරණ හේතුවක් නොමැතිව ඒ දැන්වීමේ නියම අනුව ක්‍රියා කිරීම පැහැර හරින ලද බව ඔප්පු කරනු ලැබුවහොත්, ඔහු වරදකට වරදකරු විය යුතු ය.

**ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළට තෙල් බැහැර කිරීම තහනම් කිරීම**

23ත. (1) කිසිම තැනැත්තකු විසින්, තෙල් කිසිවක් හෝ තෙල් අඩංගු යම් මිශ්‍රණයක් හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය තුළට පිට කිරීම හෝ වැක්කිරීම නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු, වරදකරු කරනු ලැබීමේදී රුපියල් දස දහසකට නොඅඩු වූ ද, රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන්නාවූ ද දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ යටත් විය යුතු ය.

**යම් ද්‍රව්‍යයක් හෝ උපකරණයක් පාවිච්චි කිරීම තහනම් කිරීමට හෝ පාවිච්චි කරන ලෙස නියම කිරීමට ඇති බලය.**

23ද. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි සඳහන් ප්‍රදේශ ඇතුළත, පරිසරයේ ගුණාත්මක භාවයට අන්තරාදායක වන—

(අ) යම් ද්‍රව්‍ය, යම් කාර්යාවලියක්, වෙළඳාමක් හෝ කර්මාන්තයක් සඳහා පාවිච්චි කිරීම තහනම් කිරීම ;

(ආ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් විස්තර කිරීම අනුව හෝ වෙළඳ ලකුණ අනුව පාවිච්චි කිරීම තහනම් කිරීම

කළ හැකි ය.

(2) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ නියමයෙහි සඳහන් ප්‍රදේශ ඇතුළත යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක්, ඉදි කරන ලෙස, අලුත්වැඩියා කරන ලෙස, පවත්වා ගෙන යන ලෙස හෝ ක්‍රියාත්මක කරන ලෙස නියම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන හා (2) වන උපවගන්ති යටතේ සාදන ලද යම් නියෝගයක වූ යම් තහනම් කිරීමක් කඩ කරන හෝ යම් නියමයක් අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු ය.

**සහතිකය එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් මුල් බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු බව.**

23න. මේ පනතේ මේ කොටස යටතේ වරදක් සම්බන්ධයෙන් වූ නඩු පැවරීමක දී, අධ්‍යක්ෂ—ජනරාල්වරයාගේ අත්සන යටතේ නිකුත් කරන ලද සහතිකයක සඳහන් පරිසර දූෂණය, ඒ පරිසරයට කර ඇති බවට ඒ සාක්ෂි වශයෙන් ඒ සහතිකය ආවේශ්‍ය කරනු ලැබිය යුතු අතර, එහි ඇතුළත් කාරණා සම්බන්ධයෙන් එය මුල් බැල්මට පෙනෙන සාධකයක් ද වන්නේ ය.

## IV ඇ කොටස

### ව්‍යාපෘතීන් අනුමත කිරීම

**ව්‍යාපෘතීන් අනුමත කිරීමේ අනුයෝජිත ආයතන.**

23ප. මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ව්‍යාපෘති අනුමත කිරීමේ අනු

යෝජිත ආයතන විය යුතු (මේ කොටසේ මෙහි මින්මතු "ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය අනුයෝජිත ආයතනය සඳහන් කරනු ලැබිය හැකි ය.

**නියමිත ව්‍යාපෘති.**

23ඔ. ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, මේ පනතේ මේ කොටසේ විධිවිධාන යටතේ අනුමතය ලබා ගැනීම අවශ්‍ය වන්නාවූ (මෙහි මින්මතු "නියමිත ව්‍යාපෘති" යනුවෙන් සඳහන් කරනු ලබන) ව්‍යාපෘති හා ව්‍යාපාර නිශ්චය කරනු ලැබිය යුතු ය.

**නියමිත ව්‍යාපෘති අනුමත කිරීම.**

23ඔඔ. (1) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන කෙසේ වුව ද මේ පනත ක්‍රියාත්මකවීමේ දින සිට හා ඉන් පසුව ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්, පළාත් පාලන ආයතනයක්, සමාගමක්, ව්‍යාපාරික ආයතනයක් හෝ පුද්ගලයෙක් විසින් ශ්‍රී ලංකාවේ ආරම්භ කරනු ලබන සියලුම නියමිත ව්‍යාපෘතියක් විසින්, ඒ නියමිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, මේ පනත යටතේ අනුමතය ලබා ගත යුතු ලෙස නියම කරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් අනුමතය, ඒ නියමිත ව්‍යාපෘතියට අදාළ හෝ ඒ හා සම්බන්ධ උචිත ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයෙන් ලබා ගනු ලැබිය යුතු ය :

එසේ වුව ද, අමාත්‍යවරයා විසින් නිශ්චිය කරනු ලැබිය යුතු ඇතැම් නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින් හුදෙක් අධිකාරියේ එකඟත්වය ඇතිව අනුමතය ප්‍රදානය කරනු ලැබේ.

**පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව ඉදිරිපත් කිරීම.**

23ඔඔඔ. (1) යම් ව්‍යාපෘතියකට අදාළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින් නියම කළ හැකි පරිදි වූ ද තත් කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියම කළ හැකි යම් තොරතුරු හා විස්තර ඇතුළත් වන්නා වූ ද මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් නිශ්චිත කාලයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස, ස්වකීය අනුමතය සඳහා යම් නියමිත ව්‍යාපෘතියක් ඉදිරිපත් කරන යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවකින්, ව්‍යවස්ථාපිත මණ්ඩලයකින්, පළාත් පාලන ආයතනයකින්, සමාගමකින්, ව්‍යාපාරික ආයතනයකින් හෝ පුද්ගලයකුගෙන් ඉල්ලා සිටීම ව්‍යාපෘති අනුමත කිරීමේ සෑම අනුයෝජිත ආයතනයකම යුතුකම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පනවා ඇති නියමයට අනුකූලව ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් වෙත ඉදිරිපත් කරන ලද, අවස්ථාවෝචිත පරිදි, මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් හෝ පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාවක් හෝ ලැබුණු විට ඒ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින්, ගැසට් පත්‍රයේ ද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවෙන් පළ වන එක් ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලබන දැන්වීමක් මගින් එම වාර්තාව මහජනයා විසින් පරීක්ෂා කරනු ලැබිය හැකි ස්ථාන සහ වේලාව දැනුම් දෙනු ලැබිය යුතු අතර, ඒ පිළිබඳව අදහස් කිසිවක් දැක්වීමට ඇත්නම්, එසේ දක්වන ලෙස මහජනයාට ආරාධනා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ දැන්වීමක් පළ කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත මහජනයාගෙන් යම් සාමාජිකයකු විසින්, එම දැන්වීම පළ කළ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත ඒ පිළිබඳව තමාගේ අදහස් කිසිවක් ඇත්නම්, ඒ අදහස් දැක්විය හැකි ය. තව ද තමන්ගේ අදහස් සනාථ කිරීම සඳහා කරුණු දැක්වීමේ අවස්ථාවක් ඒ තැනැත්තාට දීම මහජන යහපත පිණිස වේයැයි එම ආයතනය විසින් සලකනු ලබන අවස්ථාවක එම ආයතනය විසින් එම තැනැත්තාට එසේ කරුණු දැක්වීමේ අවස්ථාවක් ලබා දිය හැකි අතර එම නියමිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ස්වකීය අනුමැතිය දිය යුතු යැයි තීරණය කිරීමේලා ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය විසින්, එකී කරුණු දැක්වීමේ දී හෙළි කරන ලද අදහස් සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් සැලකිල්ල දක්වනු ලැබිය යුතුය.

(4) යම් නියමිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමතිය දෙන ලද අවස්ථාවක, එම අනුමතිය ගැසට් පත්‍රයේ ද, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවෙන් පළ වන එක් එක් ප්‍රවෘත්ති පත්‍රයක ද පළ කරනු ලැබිය යුතු ය.

**ය ටිපාටිය නියමිත මාර්ගෝපදේශ පදනම් කර ගත යුතු බව.**

23 ඇඇ. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන වෙත අනුමතය සඳහා ඉදිරිපත් කරනු ලබන නියමිත ව්‍යාපෘති කිසිවක් අනුමත කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඒ ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතන විසින් නිර්ණය කරනු ලැබිය යුතු ය. ඒ කාර්ය පටිපාටිය අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා නියම කරනු ලබන මාර්ගෝපදේශ අනුව පදනම් කර ගත යුතු ය.

**අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීම.**

23 ඈඈ. (1) ස්වකීය අනුමතය සඳහා ඉදිරිපත් කරන ලද යම් නියමිත ව්‍යාපෘතියක් සඳහා අනුමතය දීම ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ඒ නිර්ණයට විරුද්ධව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනය කිරීමට අතෘප්තියට පත් තැනැත්තාට හෝ පුද්ගල මණ්ඩලයට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(2) එවැනි අභියාචනයක් මත අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

**යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දැමීම හෝ වෙනස් කිරීම.**

23 ඉඉ. අනුමතය ප්‍රදානය කොට ඇති යම් නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වෙනස් කිරීම් කිසිවක් සිදු කරනු ලබන අවස්ථාවක හෝ දැනට මත් අනුමත කොට ඇති යම් නියමිත ව්‍යාපෘතියක් අතහැර දමනු ලබන අවස්ථාවක, එවැනි අනුමතයක් ලබාගත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව, සංස්ථාව, ව්‍යවස්ථාපිත මණ්ඩලය, පළාත් පාලන ආයතනය, සමාගම, වෙළඳ ආයතනය හෝ පුද්ගලයා විසින් උචිත ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනය වෙත අවස්ථාවෝචිත පරිදි ඒ වෙනස් කිරීම හෝ අත්හැර දැමීම හෝ පිළිබඳව දැනුම් දිය යුතු අතර, අවශ්‍ය අවස්ථාවක, දැනට මත් අනුමතය ප්‍රදානය කොට ඇති එවැනි නියමිත ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් කිරීමට අදහස් කරනු ලබන වෙනස් කිරීම් කිසිවක් සම්බන්ධයෙන් නැවත අනුමතය ලබා ගත යුතුය :

එසේ වුව ද, අතහැර දමනු ලබන හෝ වෙනස් කරනු ලබන ඒ නියමිත ව්‍යාපෘතිය, අධිකාරියේ එකඟත්වය ඇතිව අනුමත කරන ලද ව්‍යාපෘතියක් වන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් අධිකාරියට ද දැනුම් දෙනු ලැබිය යුතු අතර, ලබා ගැනීමට අවශ්‍ය වන්නා වූ යම් අළුත් අනුමතයක් අධිකාරියේ එකඟත්වය ඇතිව පමණක් දෙනු ලැබිය යුතු ය.

**අනුමත නියමිත ව්‍යාපෘති සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.**

23ඊඊ. ව්‍යාපෘති අනුමත කිරීමේ අනුයෝජිත ආයතනයක් විසින් අනුමතය ප්‍රදානය කරන ලද එක් එක් නියමිත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වාර්තාවක් අධිකාරිය වෙත ඉදිරිපත් කිරීම ඒ සෑම අනුයෝජිත ආයතනයකම යුතුකම විය යුතුය. ”.

**ප්‍රධාන ප්‍රඥප්තියෙහි 24 අ අලුත් වගන්තිය ඇතුලත් කිරීම.**

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 24අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

**“ ඇතුළු වී සෝදිසි කිරීමේ බලය.**

24අ. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් කවර හෝ වේලාවක යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළුව :—

(අ) යම් උපකරණයක් හෝ කාර්මික පිරියතක් පරීක්ෂා කිරීම හා සෝදිසි කිරීම ;

(ආ) එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන්, පිට කරනු ලබන, බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන නැත හොත් සාමාන්‍යයෙන් පිට කරනු ලබන, බැහැර කරනු ලබන හෝ තැන්පත් කරනු ලබන පන්තියක හෝ වර්ගයක විය හැකි යම් දූෂණ කාරකයන්ගේ සෑම්පල ගැනීම ;

(ඇ) ඒ උපකරණයේ හෝ කාර්මික පිරියතේ ක්‍රියාකාරිත්වයට හෝ පාවිච්චියට අදාළ වූ හෝ එම උපකරණයෙන් හෝ කාර්මික පිරියතෙන් පිට කිරීමට, බැහැර කිරීමට හෝ තැන්පත් කිරීමට අදාළ වූ යම් පොත්, වාර්තා හෝ ලේඛන පරීක්ෂා කිරීම ;

(ඈ) ඒ උපකරණයේ හෝ කාර්මික පිරියතේ ඡායාරූපයක් ගැනීම හෝ අවශ්‍ය යයි තමා සලකන එම පරීක්ෂණය පවත්වා ගෙන යාමේදී දක්නට ලැබෙන යම් පොත්වල, වාර්තාවල හෝ ලේඛනවල පිටපත් ගැනීම ; හෝ

(ඉ) එම පරිශ්‍රය තුළ හෝ ඒ මත පවත්වා ගෙන යනු ලබන එම වෙළඳාමෙහි, කර්මාන්තයෙහි හෝ කාර්යාවලියෙහි පාවිච්චි කරනු ලබන, පාවිච්චි කරනු ලැබිය හැකි හෝ සාමාන්‍යයෙන් පාවිච්චි කරනු ලබන යම් ඉන්ධනයක, වස්තුවක හෝ ද්‍රව්‍යයක සැම්පල ගැනීම

කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ තම කාර්ය යන් ඉටු කිරීමේ දී, යම් තදබල බාධක ඇතිවිය හැකි බවට අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයාට හෝ සාධාරණ හේතු පෙනී යන අවස්ථාවක, ඔහුට පොලිස් නිලධර යකු සමඟ යම් ඉඩමකට හෝ ස්ථානයකට ඇතුළු විය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ එවැනි සෝදිසි කිරීමක් හෝ විමර්ශනයක් කරගෙන යාමේ දී, දත්ත සටහන් කිරීමේ දී හෝ සැම්පල ගැනීමේ දී අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ බලය ලත් නිලධරයකු හෝ වළක්වන නැතහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ බලය ලත් නිලධරයාට බාධා පමුණුවන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

අධිකාරිය විසින් විධාන නිකුත් කළ යුතු බව.

24ආ. (1) පරිසරයට හානියක් හෝ අනර්ථයක් සිදු කරන හෝ සිදුවීමට ඉඩ ඇති යම් සංවර්ධන ව්‍යාපෘතියක හෝ යෝජනා ක්‍රමයක නිරතව සිටින හෝ නිරතවීමට ආසන්න යම් තැනැත්තකු වෙත, ඒ හානිය හෝ අනර්ථය වැළැක්වීම හෝ නතර කිරීම සඳහා ගත යුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමට අධිකාරියට බලය ඇති අතර, එම විධාන අනුව ක්‍රියා කිරීම ඒ තැනැත්තාගේ යුතුකම විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද විධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලැබූ අවස්ථාවක, ඒ විධානයේ සඳහන් පියවර ඒ තැනැත්තා විසින් ගනු ලබන තෙක් මහෙස්ත්‍රාත්වරයා විසින් අධිකාරිය විසින් කරනු ලබන ඉල්ලීම මත ඒ ව්‍යාපෘතිය හෝ යෝජනාක්‍රමය තාවකාලිකව අත් හිටුවන ලෙස ආඥා කළ හැකි ය.

පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වශයෙන් ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

24ඇ. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් යම් ප්‍රදේශයක් (මෙහි මින්මතු "ආරක්ෂක ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කළ හැකි ය.

(2) ප්‍රදේශයක්, ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් මගින්, ඒ ප්‍රදේශයේ ඉම් සලකුණු හා සීමා දැක්වීමෙන් ඒ ප්‍රදේශයේ මායිම් නියම කළ යුතු ය.

**ආරක්ෂක ප්‍රදේශ තුළ වෙනත් යම් නීති අදාළ වීම.**

24ඇ. (1) යම් ප්‍රදේශයක්, ආරක්ෂක ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින්, මේ පනතේ විධිවිධාන කිසිවක් සමග ගැටෙන්නා වූ යම් නීතියක විධිවිධාන යටතේ ඒ ආරක්ෂක ප්‍රදේශයේ වූ යම් සැලසුම් යෝජනා ක්‍රමයක් හෝ ව්‍යාපෘතියක් ඒ ප්‍රදේශයේ ක්‍රියාත්මකවීම නතර විය යුතු යයි ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ නියමයක් බලාත්මකව පවත්නා තාක් කල්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඒ ප්‍රදේශයේ භෞතික සැලසුම් සම්පාදනය සම්බන්ධයෙන් අධිකාරිය වග කිව යුතුය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධාන කෙසේ වුවද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි සඳහන් යම් දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි, අධිකාරිය, ඒ ආරක්ෂක ප්‍රදේශයේ සැලසුම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් වගකීම දැරීම නතර විය යුතු බව අධිකාරියේ ඉල්ලීම පිට අමාත්‍යවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(4) ආරක්ෂක ප්‍රදේශයකට අදාළව 24 වන වගන්තිය යටතේ වූ නියෝගයක් බලාත්මකව පවත්නා තාක් කල්, අධිකාරිය නොවන කිසිම තැනැත්තකු විසින්, ඒ ආරක්ෂක ප්‍රදේශය ඇතුළත සැලසුම් සම්පාදනයට සහ සංවර්ධනයට අදාළ බලතල, කාර්ය හා කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම නොකළ යුත්තේ ය. ".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය සංශෝධනය කිරීම.**

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන හා (2) වන උපවගන්ති ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

" (1) (5) වන උපවගන්තියට යටත්ව, අධිකාරිය විසින්, නියමයක් මගින්, මේ පනත යටතේ අධිකාරිය සතු බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් රජයේ නිලධරයකුට පවරා දෙනු ලැබිය හැකි ය

(2) (1) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් යම් බලයක් ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවකට, සංස්ථාවකට, ව්‍යවස්ථාපිත මණ්ඩලයකට, පළාත් පාලන ආයතනයකට හෝ යම් රජයේ නිලධරයකුට පවරා දෙනු ලැබූ අවස්ථාවක, ඒ බලතලවලින් කිසිවක් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්ම ක්‍රියාත්මක කරන ලද්දේ නම්, ඔහු විසින් ක්‍රියාත්මක කළ හැකිව තිබුණු බලතලවලින් කිසිවක්, අවස්ථාවෝචිත පරිදි, ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවේ, සංස්ථාවේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයේ හෝ පළාත් පාලන ආයතනයේ යම් නිලධරයකු විසින් හෝ ඒ රජයේ නිලධරයා විසින් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.".

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ (ආ) ඡේදය අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්—

"(ආ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ රජයේ නිලධරයකු සම්බන්ධයෙන් වන විටක, ඒ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය හෝ ඒ රජයේ නිලධරයා සේවයේ නියුක්තව සිටින දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව හැර;".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"කිසිම දඬුවමක් සඳහා ප්‍රකාශිතවම විධිවිධාන සලසනු ලැබ නොමැති වැරදි සඳහා දණ්ඩනය.**

31. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ යම් විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හෝ ඒ විධිවිධාන අනුව කටයුතු කිරීම පැහැරහැරීම සම්බන්ධයෙන් හෝ පැමිණවිය යුතු දඬුවමක් සඳහා ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නොමැති විටක, එවැනි උල්ලංඝනයක් හෝ පැහැර හැරීමක් කරන සෑම තැනැත්තකුම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට, අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් වන්නේ ය.".

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.**

**"නියෝග.**

32. (1) නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් ප්‍රකාශිත හෝ නියමිත හෝ මේ පනතින් නියෝග සෑදීමට අවශ්‍ය සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන්ම හා (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත දැක්වෙන කාරණා සියල්ලම හෝ ඉන් කිසිවක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) (i) සවිකිරීම්වලට හෝ යෝජිත සවිකිරීම් වලට අදාළ පිඹුරු, පිරිවිතර සහ තොරතුරු පරීක්ෂා කිරීම ;

(ii) මේ පනත යටතේ නිකුත් කිරීම ;

සහ

(iii) අවශ්‍ය තතු පිරික්සීමේ කාර්ය ඉටු කිරීම

සම්බන්ධයෙන් ගාස්තු අය කිරීම ;

(ආ) යම් ජාතික පාරිසරික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම හෝ පරිසරය ආරක්ෂා කිරීම සඳහා සහ එය වැඩදායි ලෙස උපයෝගී කර ගැනීම ආරක්ෂා කිරීම සඳහා වර්ගීකරණය කිරීම සම්බන්ධයෙන් වූ ප්‍රමිති හෝ උපමාන දැක්වීම ;

(ඇ) යම් ද්‍රව්‍යයක්, ක්‍රියාවක් හෝ දෙයක් විෂ සහිත ද, අහිතකර ද, පිළිකුල් සහගත ද, සෞඛ්‍යයට හානිකර ද යන වග නැතහොත් මේ පනතේ සඳහන් වෙනත් යම් විස්තරයකට අයත් වේ ද යන වග නිශ්චය කිරීමෙහි ලා ප්‍රමිති හෝ උපමාන දැක්වීම ;

(ඈ) දියර, ඝන හෝ වායු වන්නා වූ යම් ද්‍රව්‍යයක් හෝ විකිරණශීලී යම් ද්‍රව්‍යයක් පරිසරයට බැහැර කිරීම, පිට කිරීම හෝ එහි තැන්පත් කිරීම තහනම් කිරීම සහ යම් නිශ්චිත ඉන්ධනයක පාවිච්චිය තහනම් කිරීම හෝ එය විධිමත් කිරීම ;

(ඉ) අවට ඇති වායුවේ ගුණාත්මක ප්‍රමිති සහ පිට කිරීමේ ප්‍රමිති දැක්වීම සහ වායු ගෝලයේ පැවතිය හැකි හෝ වායු ගෝලයට බැහැර කළ හැකි යම් ද්‍රව්‍යයක් එක් රැස්වීම උපරිම වශයෙන් ඉඩ දිය හැකි ප්‍රමාණය දැක්වීම ;

(ඊ) දූෂණය සිදුවීමට සමත් යම් උපකරණයක් පහසුකමක්, වාහනයක් හෝ බෝට්ටුවක් පාවිච්චි කිරීම තහනම් කිරීම නැතහොත් දූෂණය වැළැක්වීම හෝ අඩු කිරීම ඇති වන පරිදි ඒවා තැනීම, සවි කිරීම හෝ ක්‍රියාත්මක කිරීම විධිමත් කිරීම :

(උ) දූෂණය පිළිබඳ අනතුරු ඇඟවීම් හෝ සෝදිසියෙන් සිටීමේ දැන්වීම් නිකුත් කිරීමේ අවශ්‍යතාව ;

(ඌ) කසළ හෝ පහසුවෙන් දැවෙන වෙනත් ද්‍රව්‍ය එළිමහනේ පිළිස්සීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

(එ) පොළොව මත හෝ ඇතුළත ඝන හෝ දියර අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථාන පිහිටුවීම විධිමත් කිරීම ;

(ඒ) අමනෝඥ ශබ්ද කවරේදැයි නිශ්චය කිරීම සහ මධ්‍යස්ථ ප්‍රමාණයේ වූ ශබ්ද සඳහා ප්‍රමිති දැක්වීම ;

(ඔ) සෞඛ්‍යයට හෝ සුභසාධනයට හානිකර විය හැකි වූ හෝ ප්‍රතිවිරුද්ධ සංස්කෘතික බල පෑම ඇතිවිය හැකි වූ නැතහොත් දූෂණය වැලැක්වීම සඳහා යම් ජල තීරයක හෝ ඒ අවට නෑම, පිහිනීම, බෝට්ටු පැදීම හෝ වෙනත් කටයුත්තක් කිරීම තහනම් කිරීම හෝ විධිමත් කිරීම ;

(ඕ) ස්වකීය ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී උද්ගත විය හැකි, ශ්‍රී ලංකාවේ ජල තීරය යම් තෙලකින් දූෂණය වීම සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස අවශ්‍ය යම් මූල ද්‍රව්‍යයක් හෝ ද්‍රව්‍යයක් හා උපකරණයක් ගබඩා කළ යුතු යයි ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන තෙල් පිරිපහදුවලට හා බලාගාරවලට නියම කිරීම ;

(ක) තෙල් අඩංගුවීමෙන් යම් පිටාර ගලායාමක් අඩු කිරීමේ හෝ වැළැක්වීමේ කාර්යය සඳහා නියම කරනු ලැබිය හැකි යම් උපකරණයක්, ව්‍යාපාර කටයුතු කර ගෙන යන තෙල් පිරිපහදු විසින් සවි කළ යුතු යයි නියම කිරීම ;

(ග) අධිකාරිය විසින් කරනු ලබන නිශ්චය කිරීමකට විරුද්ධව වූ අභියාචනාවලට අදාළ කාර්ය පටිපාටිය නියම කිරීම ;

(ච) නගරබද හා ගම්බද ප්‍රදේශවල ඇති දෘෂ්ටි ප්‍රසන්නතා ඇති කිරීම සම්බන්ධයෙන් ;

(ජ) උපද්‍රවකාරී ද්‍රව්‍ය ගබඩා කිරීම සහ ප්‍රවාහනය කිරීම ;

(ට) වායුගෝලයට, ජල තීරයට හෝ පසට හෝ වුව ද අපද්‍රව්‍ය සහ උපද්‍රවකාරී ද්‍රව්‍ය බැහැර කිරීම ; සහ

(ඩ) සංවර්ධක විසින් හෝ තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ නිශ්චිත තෘතීය පාර්ශ්ව කරුවකු විසින් නිශ්චිත පාරිසරික තතු පිරික්සීමේ කාර්ය ඉටු කිරීම නියම කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක් ම, එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූවා ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය. යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙය සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.".

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය මෙහි පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම.**

(අ) "වැඩදායී ලෙස උපයෝගී කර ගැනීම" යන්නෙහි අර්ථ කථනයට පෙරාතුවම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"වායු දූෂණය" යන්නෙන් ශාකවලට, සත්වයන්ට, මනුෂ්‍ය වර්ගයාට හා අජීවී වස්තූන්ට අනිෂ්ට විපාක ඇතිකර වන වාතයෙහි භෞතික, රසායනික හා ජෛව ලක්ෂණයන්ගේ වෙනස්වීමක් අදහස් වේ ;

(ආ) "පරිසරය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"පාරිසරික බලපෑම තක්සේරු කිරීමේ වාර්තාව" යන්නෙන්, යෝජිත නියමිත ව්‍යාපෘතියක අපේක්ෂිත පාරිසරික විපාක අදහස් වන අතර, පාරිසරික පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් පිළියෙල කර ඇත් නම් එය අඩංගු වන යෝජිත නියමිත ව්‍යාපෘතියේ වැළැක්විය හැකි හා නොවැළැක්විය හැකි අනිෂ්ට පාරිසරික විපාක පිළිබඳ විස්තරයක් ද වඩා අඩුවෙන් පරිසරයට හානිකර විය හැකි නියාකාරීත්වයේ විකල්පයන් හා ඒ විකල්පයන් ප්‍රතික්ෂේප කරන ලද්දේ කවර හේතු නිසා ද යන්න පිළිබඳ විස්තරයක් සහ යෝජිත නියමිත ව්‍යාපෘතියට අවශ්‍ය සම්පත්වල වෙනස් කළ නොහැකි හා අප්‍රති කාර්ය බැඳීම් කිසිවක් පිළිබඳ විස්තරයක් ද ඊට ඇතුළත් වේ

"මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව" යන්නෙන් පරිසරය කෙරෙහි නියමිත යෝජිත ක්‍රමය නිසා ඇති විය හැකි බලපෑම් වැදගත් වන්නේද යන්න සලකා බැලීම පිණිස ඒ බලපෑම් තක්සේරු කරන ලියවිල්ලකින් වූ වාර්තාවක් අදහස් වන අතර, ඒ අනුව පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් පිළියෙල කිරීම අවශ්‍ය වන්නේය. එම වාර්තාවට, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වැඩිදුර තොරතුරු, විස්තර, දත්ත, සිතියම්, සැලසුම් සහ වෙනත් තොරතුරු සහ විස්තර ඇතුළත් විය යුතුය ;

(ඇ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ සංවර්ධන සභාවක් අදහස් වන අතර, එවැනි යම් සභාවක් මගින් ක්‍රියාත්මක කරනු ලබන හා ඉටු කරනු ලබන බල තලවලට, කාර්යයන්ට හා කර්තව්‍යයන්ට අනුරූපී හෝ ඒ හා සමාන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ ඒ යටතේ ඇති කොට පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ ;

(ඈ) "පළාත් පාලන ආයතනය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ කථන ඇතුළත් කිරීමෙන් :—

"ශබ්ද දූෂණය" යන්නෙන් කෝපාවිෂ්ටවීම, වෙහෙස දැනීම හෝ ඇසීම දුර්වල වීම සිදු කරන නැතහොත් වික්ෂිප්ත වීම මගින් වෙනත් නාද දැනීමෙහි ලා සහ නිර්මාණාත්මක ක්‍රියාකාරිත්වයෙහිලා බාධා ඇති වන මට්ටමේ නාදයක් පැවතීම අදහස් වේ ;

"දූෂණකාරකය" යන්නෙන්, සෘජුවම හෝ අන්‍යාකාරයෙන්—

(අ) යම් වැඩදායී ලෙස උපයෝගී කර ගැනීමකට අනිෂ්ට ලෙස බලපාන පරිදි ග්‍රාහක පරිසරයේ යම් ඛණ්ඩයක හෝ මූල ධාතුවක ගුණය වෙනස් කරන ; හෝ

(ආ) සෞඛ්‍යයට උපද්‍රවකාරී හෝ සම්භාව්‍ය උපද්‍රව කාරී වන

දියර, ඝන හෝ වායු වන්නා වූ යම් මූල ද්‍රව්‍යයක් අදහස් වේ ; තවද

(ඉ) "දේශීය ජල තීරය" යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

"විෂ රසායනික ද්‍රව්‍ය" යන්නෙන්, සජීවී ද්‍රව්‍ය කෙරෙහි අහිතකර බලපෑම් ඇතිකර වන්නා වූ හෝ පරිසර යෙහි උපද්‍රවකාරී විපර්යාසයන් ඇති කරවිය හැක්කා වූ නිශ්චිත අණුක සංයුතියක් මගින් පිළිබිඹු වන මූල ද්‍රව්‍යයක් අදහස් වේ.

1989-3-10

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.